ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## <u>පුවත්පත් නිවේදනය</u>

# ඉන්දියාව ගෝලීය යහපත උදෙසා වඩා වැඩි ධාරිතාවයන් නිර්මාණය කිරීමට කැප වේ

2022 සැප්තැම්බර් 24 වන දින නිව්යෝක් හි පැවති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 77වන සැසිවාරයේදී ඉන්දියාව විසින් සිදු කළ ප්‍රකාශය ලොව ම එක් පවුලක් (වාසුධයිව කුටුම්භකම්) ලෙස දැකීමේ ඉන්දියාවේ ඉපැරණි දැක්ම පිළිඹිබු කරයි. විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතා සැසිවාරය අමතමින් ප්‍රකාශ කළේ ඉදිරි විසි පස් වසර තුළ ගෝලීය යහපත උදෙසා වඩා වැඩි ධාරිතාවයන් නිර්මාණය කිරීමට ඉන්දියාව අදිටන් කොටගෙන ඇති බව යි. ත්‍රස්තවාදය, වසංගත හෝ පරිසරය වැනි ගෝලීය ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී එක්සත්ව ක්‍රියා කළ යුතු බව එතුමා සඳහන් කළේය. ලොව පුරා ඉන්දියාව විසින් ක්‍රියාත්මක කර ඇති 700කට අධික ව්‍යාපෘතීන් මගින් අවධාරණය කෙරෙන්නේ හරිත සංවර්ධනය, ඉහළ සම්බන්ධකතාවය, ඩිජිටල් තාක්ෂණය සහ සෞඛ්‍ය වැනි ක්ෂේත්‍රයන් වෙත ලබාදෙන අවධානය යි.

2. සිය සහකරුවන්ගේ අවශ්‍යතා සහ ප්‍රමුඛතාවන්ට අනුකූලව ප්‍රතිචාර දැක්වීමේ ඉන්දියාවේ දර්ශනය අවධාරණය කරමින් විදේශ කටයුතු අමාත්‍යතුමා ප්‍රකාශ කළේ ඉන්දියාව ආසියාවේ, අප්‍රිකාවේ සහ ලතින් ඇමරිකාවේ සහෝදර සහෝදරියන් වෙත සහයෝගීතාවයන් පිරිනමන බවයි. රටවල් 100කට අධික ප්‍රමාණයකට එන්නත් සැපයීම මෙම ප්‍රවේශය සඳහා සාක්ෂ්‍යයකි. ඉන්දියාවේ මානුෂීය ආධාර සහ ආපද සහන මුදවාගැනීමේ මෙහෙයුම් සැමවිටම පීඩාවට පත් ඉන්දීය නොවන ජාතිකයන්ට සේවය ලබා දී ඇත.

3. ඉන්දියාවේ අසල්වැසි රාජ්‍යයන් පිළිබ ඳව අදහස් දක්වමින් විදේශ කටයුතු අමාත්‍යතුමා සඳහන් කළේ දුර්වල ආර්ථිකයන් හි ණය ගොඩගැසීම විශේෂ අවධානයක් හිමිවන කරුණක් බවයි. පටු ජාතික න්‍යාය පත්‍රයන්ගෙන් ඔබ්බට නැඟී සිටින ලෙස ජාත්‍යන්තර ප්‍රජාවට ආරාධනා කළ එතුමා 2022 වසරේදී ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ලබා දුන් ඇමරිකානු ඩොලර් බිලියන 3.8ක පෙර නොවූ විරූ සහයෝගය අසාමාන්‍ය කාලයකදී ඉන්දියාව විසින් ගත් අසාමාන්‍ය පියවරක් බව සඳහන් කළේය. ආපදු ප්‍රතිචාර සහ මානුෂීය ආධාර වැනි කාරණාවන් හිදී ඉන්දියාව තම අසල්වැසියන්ට ශක්තියක් වී ඇති බව ද එතුමා අවධාරණය කළේය.

4. සාමය, සංවාදය සහ රාජ්‍ය තාන්ත්‍රිකත්වය සම්බන්ධයන් ඉන්දියාවේ අඛණ්ඩ අවධාරණය පෙන්වා දුන් එතුමා මෙය යුද්ධ හෝ ගැටුම්වලට කාලසීමාවක් නොවන බවත් සංවර්ධනය සහ සහයෝගය සඳහා කාලසීමාවක් වන බවත් සඳහන් ක ළේය. එසේම, ඉන්දියාව කිසිසේත්ම ත්‍රස්තවාදය නොඉවසන බව එතුමා අවධාරණය කළේය.

5. ග්ලාස්ගෝ හි පැවති COP26 සමුළුව අතරතුරදී අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා විසින් සොබාදම් මාතාවට ඉන්දියාවේ උපහාරය ලෙස ප්‍රකාශ කළ “පරිසරය වෙනුවෙන් ජීවන විලාසිතාව” (LiFE) යන අදහස පිළිබඳ සඳහන් කරමින් විදේශ කටයුතු අමාත්‍යතුමා පරිසරය සුරැකීමට සහ ගෝලීය සුවතාවය වර්ධනය කිරීමට ගන්නා ඕනෑම ඒකාබද්ධ සහ සාධාරණාත්මක ප්‍රයත්නයන්ට ඉන්දියාව සහයෝගය ලබා දෙන බව අවධාරණය කළේය.

6. ගෝලීය දකුණ විසින් මුහුණ දෙන අසාධාරණත්වය තීරණාත්මකව විසඳගත යුතු බව අවධාරණය කළ එතුමා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ ප්‍රතිසංස්කරණ මූලික කරගත් ප්‍රතිසංස්කරණය වූ බහුපාර්ශවීයත්වයක් උදෙසා වඩා ඉහළ වගකීමක් දැරීමට ඉන්දියාව සූදනම් බව ප්‍රකාශ කළේය. එක්සත් ජාතීන්ගේ

සාමාජික රටවලින් සැලකිය යුතු සහයෝගයක් මේ සඳහා හිමි වූ බව ද එතුමා සඳහන් කළේය.

***

කොළඹ
2022 සැප්තැම්බර් 26